# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
## நிதி, திட்டமிடல் அமைச்சு
## MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බඩ්/356/අයිඩී/2009/09
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2011.10.31

අයවැය චක්‍රලේඛ 154

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් /
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්/ පළාත් ප්‍රධාන ලේකම්වරුන්

**<u>රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ නියැලෙන රාජ්‍ය ආයතන වෙත පවරනු ලබන ඉදිකිරීම් හා අදාළ ක්‍රියාවලි විධිමත් කිරීම</u>**

රාජ්‍ය අංශයේ ඉදිකිරීම් වලට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත වරින් වර ඉදිරිපත් කෙරෙන යෝජනා මෙන්ම 2012 අයවැය පිළිබඳව අමාත්‍යාංශ හා සම්බන්ධ වූ සාකච්ජා වලදීද ඉදිකිරීම් වලට අදාළව නිරන්තරයෙන් සිදුකෙරෙන ඇස්තමේන්තු සංශෝධනයන් පිළිබඳව කරුණු අනාවරණය විය. මේවා විමර්ශණය කිරීමේදී පැහැදිලි වන්නේ ඉදිකිරීම් අවශ්‍යතාවය හා පවතින මූල්‍ය සම්පත් පිළිබඳව නිසි ඇගයීමකින් තොරව අදාළ ඇස්තමේන්තු පිළියෙල කෙරෙන බවය. මෙම තත්ත්වය, ඉදිකිරීම් නිසි පරිදි නියමිත කාලවකවානුව තුළ අවසන් නොකිරීමට එක් ප්‍රධාන හේතුවක් වන අතරම එම ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී ගැටළු ඇති වී ඇත.

02. රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම ආයතන විසින් සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කිරීම නිසි පරිදි සිදු නොකිරීමෙන් එම ආයතන මේ වනවිට දැඩි ද්‍රවශීලතා අර්බුද වලට ලක් වී ඇති අතර ඒවායේ ඉදිරි කටයුතු පවත්වා ගෙන යාමද ඉතා දුෂ්කර කාර්යයක් වී ඇති අතර, මෙවැනි තත්ත්වයන් දිගින් දිගටම පැවතීම එම ආයතනවල ඉදිරි පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලබන බව නිරීක්ෂණය වී ඇත.

03. එබැවින්, මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට වගබලා ගැනීම සඳහා ඉහත රාජ්‍ය ආයතන මගින් ඉදිකිරීම් කටයුතු කරවා ගැනීමට කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී යෝජිත කාර්යයන් සඳහා ඔබ විසින් වගකීම් දරණ වැය ශීර්ෂයන් යටතේ මධ්‍යකාලීන අයවැය රාමුව තුළ අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි වෙන් කර ඇති බවට නිශ්චිතව තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් එවැනි ඉදිකිරීම් සඳහා අදාළ ආයතනය වෙත කොන්ත්‍රාත් පැවරීමට මින් ඉදිරියට පියවර ගත යුතුය. එසේම, රජයේ ඉදිකිරීම් ආයතනයන්ද රජයේ ආයතන වෙනුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගිවිසුම් අත්සන් කිරීමට එකඟවීමට පෙර, යෝජිත ඉදිකිරීමට අදාලව එම ආයතනවලට අදාළ වියදම් ශීර්ෂ යටතේ අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිශ්චිත ලෙසට වෙන් කර තිබේද යන්න තහවුරු කර ගැනීමට පියවර ගත යුතු වේ. ඒ අයුරින් ක්‍රියා නොකර ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඉදිරියේදී ඇති විය හැකි ගැටළු සහගත තත්ත්වයන් හමුවේ මහා භාණ්ඩාගාරය වෙත වගකීම් පැවරීම සිදුනොවිය යුතු බවද සඳහන් කරමි. මෙම උපදෙස් තරයේ පිළිපැදින බවට සහතික කර ගැනීම කෙරෙහි ඔබගේ ඇඩි අවධානය යොමු කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

පී.බී. ජයසුන්දර
ලේකම්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
05. සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
06. සභාපති, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
07. සභාපති, ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
08. විගණකාධිපති